# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,046 - 2017 නොවැම්බර් මස 17 වැනි සිකුරාදා - 2017.11.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2706 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2736 |



*සැ. යු.-* (i) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත, 2017 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත, 2017 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 දෙසැම්බර් මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 නොවැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2703 - B 81226 — 5,403 (2017/11)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙ-ාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙ-වත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලා-වකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩි-කෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේ-වකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## සංශෝධනයයි

## ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2017

2017.10.13 දිනැති අංක 2041 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීමට අදාළව අයදුම්පත් කැඳවා ඇත.

02. එම නිවේදනයේ 04 ඡේදයේ ''ශ්‍රේණි ක්‍රමයට ආරම්භක වැටුප් පියවරයන්'' පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලබන බව දන්වමි.

''ශ්‍රේණි ක්‍රමයට ආරම්භක වැටුප් පියවරයන්''

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය* |
|---|---|---|
| III | පියවර 01 | රු. 47,615 |
| II | පියවර 12 | රු. 62,595 |
| I | පියවර 20 | රු. 76,175 |

03. යථෝක්ත නිවේදනය අයදුම්කරුවන්ගේ දැන ගැනීම සඳහා පළ කරන බව ද දන්වමි.

වෛද්‍ය ආර්. එම්. ආරියදාස,
අධ්‍යක්ෂ ජනරාල්.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 13,
ගැටඹේ.
පේරාදෙණිය.

11-693

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර ක්‍රීඩා, අධ්‍යක්ෂ තනතුර සඳහා වන සීමිත බඳවා ගැනීම - 2017

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරෙහි පවතින පුරප්පාඩු 03ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ ''සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම - 2017'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2017.12.04 දින වේ.

***සටහන*** : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලබයි. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අංක 08 යටතේ සඳහන්

ලකුණු දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 දරන චක්‍රලේඛයට අනුව SL-1-2016, රු. 47,615-10 x 1,335-8x1,630-17 x 2,170 - රු. 110,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.)

3. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු වේ.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත් වේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර 05ක් තුළ දී ලබා ගත යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුන නිලධාරින් නියමිත භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

4. *අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද* :

(i) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරින්ගේ ඒකාබද්ධ සේවයේ කළමණාකරන සහකාර අධිපන්තියේ නිලධාරියෙකු වීම;

*හෝ*

(ii) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරින්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමණාකරන සහකාර - තාක්ෂණ සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම;

*හෝ*

(iii) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරින්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමණාකරන සහකාර - තාක්ෂණ සේවා ගණයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් ක්‍රීඩා හෝ කළමණාකරණ ක්ෂේත්‍රයට අදළ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(iv) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරින්ගේ ඒකාබද්ධ සේවයේ තනතුරක හෝ තනතුරුවල වසර 10 ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු වීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් ක්‍රීඩා ක්ෂේත්‍රයට අදළ උපාධියක් ලබා තිබීම.

5. *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

6. *වයස් සීමාව* : අදළ නොවේ.

7. *වෙනත් සුදුසුකම්* :

(i) තනතුරේ ස්ථිර කර තිබීම.
(ii) පූර්වාසන්න වසර පහක් (05) තුළ සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(iii) අදළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වී තිබීම.
(iv) අදළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතා ලබාගෙන තිබීම.
(v) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණකර තිබිය යුතුය.

8. *යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය* :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබාදීම කරනු ලබන අතර එම පරීක්ෂණයේ දී ම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

ව්‍යුහගත ලකුණු පටිපාටිය ඃ

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක සේවා පළපුරුද්ද | i. ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර අධීක්ෂණ තනතුරට පත්වූ දින සිට වසරකට ලකුණු 5 බැගින් (මූලස්ථාන ක්‍රීඩා නිලධාරි);<br>*හෝ*<br>ii. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්‍ෂණ සේවා ගණයේ 1 වන පන්තියට පත්වූ දින සිට වසරකට ලකුණු 4 බැගින් (පුහුණුකරු I ශ්‍රේණිය)<br>*හෝ*<br>iii. අධීක්‍ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ II වන පන්තියට පත්වූ දින සිට වසරකට ලකුණු 3 බැගින්;<br>*හෝ*<br>iv. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරින්ගේ ඒකාබද්ධ සේවයේ තනතුරක හෝ තනතුරකට පත්ව වසර 10ක් සම්පූර්ණ වූ දින සිට වසරකට ලකුණු 02 බැගින් | 30 |
| 02 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | පශ්චාත් උපාධිය සඳහා - ලකුණු 25 | 25 |
| | | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා - ලකුණු 20 | |
| | | උපාධිය සඳහා (ක්‍රීඩා හෝ ශාරීරික පුහුණු, ක්‍රීඩා කළමණාකරණය හෝ පරිපාලනය) - ලකුණු 15 | |
| | | ඩිප්ලෝමාව සඳහා - ලකුණු 10 | |
| | | සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 06කට නොඅඩු) - ලකුණු 5 (උපාධිය මූලික සුදුසුකමක් නොවන විට ලකුණු ලබා දේ.) | |
| 03 | පුහුණුකරු තනතුරේදී හා මූලස්ථාන ක්‍රීඩා නිලධාරි තනතුරේ දක්වන ලද විශේෂ දක්ෂතාවයන් | I. පුහුණුකරුවෙකු හෝ පරිපාලකවරයෙකු හෝ සංවිධායකයෙකු හෝ වෙනත් නිලතලයක් දරමින්,<br>1. ජාතික මට්ටමින් - ලකුණු 10<br>2. දකුණු ආසියාතික මට්ටමින් - ලකුණු 10<br>3. පොදු රාජ්‍ය මණ්ඩලීය ලෝක ශූරතා - ලකුණු 05<br>II. 230බී දරන පොදු ආකෘතියෙන් ලබා ඇති ප්‍රශංසා සහතික එක් සහතිකයකට ලකුණු 02 බැගින් ලකුණු 10 | 20 |
| 04 | අමතර වෘත්තීය සුදුසුකම් | ක්‍රීඩා හෝ පරිපාලන ආශ්‍රිත විෂයයන් පිළිබඳ හදාරන ලද පාඨමාලා ඃ<br>දේශීය<br>1. වසරක් හෝ ඊට වැඩි - ලකුණු 10<br>2. මාස 06ක් හෝ ඊට වැඩි - ලකුණු 07<br>3. සති 02කට වඩා වැඩි - ලකුණු 05<br>4. සති 02ට වඩා අඩු දින 02ට වැඩි - ලකුණු 03<br>විදේශීය<br>1. වසරක් හෝ ඊට වැඩි - ලකුණු 10<br>2. මාස 06 ක් හෝ ඊට වැඩි - ලකුණු 08<br>3. සති 02 කට වඩා වැඩි - ලකුණු 06<br>4. සති 02 ට වඩා අඩු දින 02ට වැඩි - ලකුණු 04 | 20 |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | ලකුණු 05 | 05 |
| | | **එකතුව** | **100** |

ක්‍රීඩා නිලධාරින්ගේ ඒකාබද්ධ සේවයේ තනතුරකට බඳවා ගැනීමේ දී ඉදිරිපත් කර ඇති සහතික සඳහා නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.

9. ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, අංක 01 සිට 07 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 08 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුලත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන මූලික සුදුසුකම් නොමැති නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදල ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම්පත්‍ර මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව සැකසිය යුතුය. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

*සැළකිය යුතුය.*- (*අ*) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(*ආ*) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සළකා බලනු නොලැබේ.

10. *සාවද්‍ය තොරතුරු සැපයීම* :

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා විධායක සේවා ගණයේ III ශ්‍රේණියට අදළ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

12. මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජයන්ත විජේරත්න,
ලේකම්,
ක්‍රීඩා අමාත්‍යාංශය.

අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

## ක්‍රීඩා අමාත්‍යාංශය

### ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරින්ගේ ඒකාබද්ධ සේවයේ විධායක සේවා ගණයේ (SL-01-2016) III වන ශ්‍රේණියේ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරට සීමිත පදනමින් බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය

01. (i) මුලකුරු සමග අගට යෙදෙන නම :
(*අ*) (සිංහලෙන්) :————.
(*ආ*) ඉංග්‍රීසියෙන්) :————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :
(*අ*) (සිංහලෙන්) :————.
(*ආ*) (ඉංග්‍රීසියෙන්) :————.

02. (i) පෞද්ගලික ලිපිනය :————.
(ii) ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය :————.
(iii) කාර්යාලයීය ලිපිනය :————.
(iv) දුරකථන අංකය : ජංගම :————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදල කොටුව තුළ ලියන්න.)

පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐

04. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

05. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

06. 2017.06.01 දිනට වයස : වර්ෂ :————. මාස :————. දින :————.

07. (අ) ඉල්ලුම්පත් කැඳවීමේ දැන්වීමේ 01 වැනි ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබේද?
අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද :————.
(*ගැසට් නිවේදනයේ* 1.1 ඡේදය අනුව සුදුසුකම් ලබන්නේ 1.1 හි I, II, III, IV යන ඒවායින් කුමකින්ද යන්න.)
:————.

i. උපාධිය ලද දිනය :————.
ii. විශ්වවිද්‍යාලය/ආයතනය :————.
iii. ලියාපදිංචි අංකය :————.
iv. බාහිර/අභ්‍යන්තර :————.
v. උපාධිය :————.
vi. විෂයයන් :————.

(ආ) දැනට දරන තනතුර :————.

ශ්‍රේණිය :————.
තනතුරට පත්වූ දිනය :————.
එම තනතුරේ ස්ථිර කළ දිනය :————.
වැටුප් කේත අංකය සහ වැටුප් පරිමාණය :————.

අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සේවා කාලයන් කිහිපයක් අදළ නම් එම සක්‍රිය හා සතුටුදයක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් කළ යුතුය.

(ඇ) *ගැසට් නිවේදනයේ* I වැනි ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අනුමත තනතුරක සේවයේ නියුතු සේවාවේ/ශ්‍රේණියේ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු 2017.06.01 දිනට සක්‍රිය හා සතුටුදයක සේවා කාලය :————.

| *සේවය/ශ්‍රේණිය නම* | *අදල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව වැටුප් කේත අංකය උදා- MN 3-2016* | *පත් වූ දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |

08. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :————.

09. පුහුණුකරු තනතුරේ හා මුලස්ථාන ක්‍රීඩා නිලධාරි තනතුරේ දක්වන ලද විශේෂ දක්ෂතාවයන් :————.

10. අමතර වෘත්තීය සුදුසුකම් :————.

11. (i) 2017.06.01 දිනට පූර්ව වසර 05 තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බව :————.
(ii) 2017.06.01 දිනට පූර්ව වසර 05 තුළ අවවාද කිරීම් හැර වෙනත් විනය දඬුවමකට ලක්වී ඇති/නැති බව :————.

12. *අයදුම්කරුගේ සහතිකය* :

(i) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි.

(ii) මා විසින් කර ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බැව් ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු වන ………………… මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත …………… තනතුරේ සේවය කරන අතර පසුගිය පස් අවුරුදු කාලය තුළ ඔහු/ඇය වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, ඔහු/ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කොට නොමැති බවද, දැනට විනයානුකූල පරීක්ෂණයකට භාජනය නොවී සිටින බවද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් දැනට දරන තනතුරෙන් මුදවා හරින/නොහරින බවද මින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ බලය
පවරන ලද නිලධාරියාගේ අත්සන (නිල මුද්‍රාව).

දිනය :————.

11-778

---

**සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

ආයුර්වේද දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ (MN-3-3/2016) තනතුරු සඳහා බඳවා ගැනීම විවෘත ධාරාව

ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන සඳහා අනුමත කාර්ය මණ්ඩල ලැයිස්තුවල පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/4/1/37/1/3/2013 හා 2014.08.19 දිනැති ලිපිය මගින් අනුමත ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුව බඳවා ගැනීමට 2017.12.17 වැනි දිනට පහත සුදුසුකම් සම්පූර්ණ කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| ගොවිපල කළමනාකරු | 03 |
| ව්‍යාප්ති නිලධාරි | 02 |
| ව්‍යාප්ති නිලධාරි (උද්භිද) | 02 |
| ව්‍යාප්ති නිලධාරි (කෘෂි) | 01 |
| තාක්ෂණ නිලධාරි | 10 |
| කාර්මික නිලධාරි (ගොඩනැගිලි) | 01 |

1. *වැටුප* :
   1.1 වැටුප් කේත අංකය : MN3-2016
   1.2 වැටුප් පරිමාණය : රු. 31,040-10x445-11x660-10x730-10x750-රු.57,550

*සටහන* : මෙම වැටුප් පරිමාණයට අදාළව වැටුප් ගෙවනු ලබන්නේ 2020.01.01 දින සිට වන අතර, එදින දක්වා ගෙවීම් සිදුකරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 උපලේඛනය ii හි විධිවිධානයන්ට යටත්ව ය.

2. *බඳවා ගන්නා ශ්‍රේණිය* : III ශ්‍රේණිය

3. *අධ්‍යාපන සුදුසුකම්* :

(*අ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී විද්‍යාව විෂය ධාරාවෙන් සියළුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම;

*සහ*

(*ආ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

4. *වෘත්තීය සුදුසුකම් :*

4.1 ගොවිපල කළමනාකරු හා ව්‍යාප්ති නිලධාරි

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

IV. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව;

*හෝ*

V. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

VI. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

VII. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ)6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

VIII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

4.2 තාක්ෂණික නිලධාරි හා කාර්මික නිලධාරි (ගොඩනැගිලි)

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව;

*හෝ*

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

VI. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ)6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5. *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

6. *වෙනත් සුදුසුකම් :*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. *වයස* :

7.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු.
7.2 උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි.

8. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

8.1 *ලිඛිත විභාගය* :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බුද්ධි පරීක්‍ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය | 100 | 40% |

8.2 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :

ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් මේ සමග අමුණා ඇති ආකෘතිය අනුව සකස්කළ අයදුම්පත් 2017.12.17 වැනි දින ප.ව. 3.00 ට පෙර දෙපාර්තමේන්තු පාලන අංශයට භාර දීම හෝ ලියාපදිංචි තැපෑලෙන් මෙම දෙපාර්තමේන්තුවට එවීමට කටයුතු කළ යුතුය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් කවර හේතුවක් මත හෝ භාර ගනු නොලබන අතර තැපෑලේ දී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - විවෘත'' යනුවෙන් සඳහන් කළ යුතුය. අසත්‍ය හෝ අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව ද වැඩිදුරටත් දන්වමි. (නියමිත අයදුම්පත හා වැඩි විස්තර www.ayurveda.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැක.)

එම්.ඩී.එම්.ඩී. කරුණාතිලක,
ආයුර්වේද කොමසාරිස්.

2017 නොවැම්බර් මස 17 වැනි දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුව,
නාවින්න,
මහරගම.

ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ .................. ................ තනතුර සඳහා බඳවා ගැනීම - විවෘත ධාරාව

1. මුලකුරු සමග නම :————.

2. සම්පූර්ණ නම :————.

3. (i) ස්ථිර ලිපිනය :————.

(ii) දුරකථන අංකය :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. (i) උපන් දිනය :————.
(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවු :————. මාස :————. දින :————.

6. අධ්‍යාපන සුදුසුකම් :

(I) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

විභාග අංකය :———. වර්ෂය :———.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* | *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

● සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න.

(II) අ.පො.ස. (උසස් පෙළ)

විභාග අංකය :———. වර්ෂය :———.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* | *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | | | 3. | | |
| 2. | | | 4. | | |

● සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න.

7. වෘත්තීය සුදුසුකම් :

| අනු. අංකය | පාඨමාලාවේ නම | හඳුරනු ලැබූ ආයතනය | කාලසීමාව |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

- සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න.

8. අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද පිළිබඳ විස්තර :

| අනු. අංකය | පළපුරුද්ද ලද ක්ෂේත්‍රය | කාලසීමාව | ආයතනය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |

9. වෙනත් සුදුසුකම් :————.

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍යබව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත්, මා සේවයෙන් පහකිරීමටත් හැකි බව මම දනිමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත්වන බව ද මෙයින් ප්‍රකාශ කරමි.

————,
අත්සන.

දිනය :————.

*අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................. මහතා/ මහත්මිය/මෙනවිය ..................................................... දින ඉහත අත්සන මා ඉදිරිපිට දී තැබූ බව සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

දිනය :————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

*අත්සන සහතික කිරීම .-* රජයේ විදුහල්පතිවරයෙකු හෝ සාමදන විනිශ්චයකාරවරයෙකු හෝ නීතිඥයෙකු හෝ රජයේ සේවයේ මාණ්ඩලික තනතුරක් දරන නිලධාරියෙකු විසින් අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන සහතික කළ යුතුය.

11 - 891

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම - 2017

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරී තනතුරු එකසිය දෙළහක් (112) සඳහා පත්කිරීමට සුදුස්සන් තෝරාගැනීම සඳහා පශු වෛද්‍ය විද්‍යා උපාධිධාරින්ගෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ ''ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය නිලධාරී තනතුර'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2017 දෙසැම්බර් 15 වැනි දින වේ.

***සටහන*** : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානී අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය. මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) පශු වෛද්‍ය නිලධාරී තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨය විසින් ප්‍රකාශයට පත්කරනු ලබන කුසලතා ලේඛනය මත බඳවා ගනු ලබනවා ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් විශ්වවිද්‍යාලයකින් පශු වෛද්‍ය උපාධි සුදුසුකම් ලබා ගන්නා අයදුම්කරුවන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන වසරට අදාළව ලියාපදිංචි දිනය අනුව අනුපිළිවෙලින් කුසලතා ලේඛනයේ අවසානයට ඇතුළත් කරනු ඇත.

(ii) පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට එක්සිය දහයක (110%) ට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, කුසලතා ලේඛනයේ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගැනීම සිදුකෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

(iii) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2 *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

i. මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

ii. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ පශු වෛද්‍ය නිලධාරි තනතුරක් පිරවීම සඳහා පත්කරනු ලැබේ.

iii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදළ මට්ටමේ ප්‍රවීණතාවයක් ලබාගත යුතුවේ. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු තනතුරෙහි ස්ථිර කිරීමට පෙර රාජ්‍ය භාෂාවක III මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතු වේ.

iv. සෙසු සේවා නියමයන් සහ සේවා කොන්දේසි 2013.12.13 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා වරින්වර නිකුත් කරන ලද සංශෝධන නියමයන්වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය* :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන 1 අනුව මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1335 - 8 x 1630 - 17 x 2170 - රු. 110,895 (SL-1-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

4. *අධ්‍යාපන සුදුසුකම්* :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක්.

5. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

6. *කායික සුදුසුකම්* :

i. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,
ii. තනතුරෙහි රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.

7. *වෙනත් සුදුසුකම්* :

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. පශු වෛද්‍ය හා පශු වෛද්‍ය වෘත්තික පනත යටතේ ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.
iv. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. *සම්මුඛ පරීක්ෂණය* :

8.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබා දෙනු නොලැබේ.)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු .- බඳවා ගැනීමේ පරිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

9. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

i. ඉල්ලුම් පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ආදර්ශ අයදුම්පත අනුව සකස් කළ යුතුය.
ii. සම්මුඛ පරීක්ෂණය සඳහා දැනුම් දුන් විට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.
   (*a*) උප්පැන්න සහතිකය,
   (*b*) උපාධි සහතිකය හා අදාළ වෙනත් සහතික,
   (*c*) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (මින් එකක් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් හා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර එවිය යුතුය.)
   (*d*) සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් සමත් වූ උසස්ම විභාගවල සහතික,
   (*e*) පශු වෛද්‍යවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමේ සහතිකය

10. *වෙනත් විධිවිධාන* :

i. මෙම *ගැසට්* නිවේදනයේ විධිවිධාන පනවා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වනු ඇත.
ii. පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.
iii. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත්විය යුතුය.
iv. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වනු ඇත.
v. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇතිනම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. සේනානායක,
ලේකම් (*වැ.බ.*),
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය.

2017 ඔක්තෝබර් මස 31 වැනි දින.

***ආදර්ශ අයදුම්පත***

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ III වන ශ්‍රේණියේ පශු වෛද්‍ය, නිලධාරි පුරප්පාඩුවලට බඳවා ගැනීමේ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (i) මුලකුරු සමග නම ඃ
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ඃ

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ඃ

02. ජාතික හැඳුනුම්පත් අංකය ඃ

03. තැපැල් ලිපිනය :————.
(ලිපිනයෙහි යම් වෙනසක් සිදුවුවහොත්, වහා ඒ බව දැනුම් දිය යුතුය)

04. ස්ථිර පදිංචි ස්ථානය අයත්,
i. පළාත් සභාව :————.
ii. දිස්ත්‍රික්කය :————.

05. උපන් දිනය ඃ වර්ෂය :————. මාසය :————. දිනය :————.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු :————. මාස :————. දින :————.

06. (*අ*) ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද යන බව :————.

(*ආ*) ජාතිය (සිංහල/ශ්‍රී ලංකා ද්‍රවිඩ/ඉන්දියානු ද්‍රවිඩ/මුස්ලිම්/වෙනත්) :————.

07. (*අ*) ස්ත්‍රී/පුරුෂ භාවය :————.
(*ආ*) විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

08. අධ්‍යාපන සුදුසුකම් ඃ

| සමත් වූ උපාධිය/පශ්චාත් උපාධි සුදුසුකම | පන්තිය | විශ්වවිද්‍යාලය | උපාධිය සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|
| 1.<br>2.<br>3. | | | |

09. ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය හා දිනය :————.

10. සේවා විස්තර : (දැනට ස්ථිර තනතුරක් දරන්නේ නම්)

| *දැනට දරන තනතුර* | *සේවා කාලය* | | *සේවා ස්ථානය* | *දෙපාර්තමේන්තුව/ පළාත් සභාව* |
|---|---|---|---|---|
| | *සිට* | *දක්වා* | | |
| 1.<br>2.<br>3. | | | | |

11. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත්වන බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත්, මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධී වරදකට වරදකරුවකු වී නොමැති බව ද මාගේ සුපුරුදු අත්සන තබා මින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(දැනට රජයේ ස්ථිර තනතුරක් දරන අපේක්ෂකයන්ට පමණක් අදාළ වේ.)

12. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

ඉහත අයදුම්කරු වූ ........................... මහතා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/........................ පළාත් සභාවේ ........... තනතුරක් දරන නිලධාරිවරයෙකු බවත් ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා මෙම නිලධාරියා තේරී පත්වුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවෙන්/පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා
(නිල මුද්‍රාව)

දිනය :————.
ලිපිනය :————.

11-800

---

**ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා නාවික හමුදව**

2018 වර්ෂයේ ඉදුරාම නිලධාරීන් සහ නිලධාරිණියන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා නාවික හමුදවේ නිලධාරීන් සහ නිලධාරිණියන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් අංශයන් සඳහා සුදුසුකම් ඇති පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

(*අ*) <u>විධායක අංශය (නිත්‍ය නාවික හමුදව)</u>

| | |
|---|---|
| නිලය | - *උප ලුතිනන් (පිරිමි)* |
| අධ්‍යාපන සුදුසුකම් | - ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යා අංශයෙන් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| වයස | - අවුරුදු 30 ට අඩු විය යුතුය. |

(ආ) <u>සාගරික ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදුව)</u>

නිලය - ලුතිනන් (පිරිමි)
අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් සාගරික/ යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.
වයස - අවුරුදු 32 ට අඩු විය යුතුය.

(ඇ) <u>මෝටර් රථ ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදුව)</u>

නිලය - ලුතිනන් (පිරිමි)
අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් යාන්ත්‍රික/ මෝටර් රථ ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.
වයස - අවුරුදු 32 ට අඩු විය යුතුය.

(ඈ) <u>වෛද්‍ය/ දන්ත වෛද්‍ය අංශය (නිත්‍ය නාවික හමුදුව)</u>

(1) <u>වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා)</u>

අධ්‍යාපන සුදුසුකම් - MBBS තෙවන විභාගයේ I වන කොටස සහ II වන කොටස සම්පූර්ණ කර තිබීම (අවසන් වසර අධ්‍යාපනය ලැබීම), දන්ත වෛද්‍ය උපාධි පාඨමාලාවේ BDS අවසන් වසර I වන කොටස සම්පූර්ණ කර තිබීම.
වයස - අවුරුදු 18 ත් 26 ත් අතර විය යුතුය.

(2) <u>උප ලුතිනන් (පිරිමි/ කාන්තා)</u>

අධ්‍යාපන සුදුසුකම් - MBBS අවසාන වසර සම්පූර්ණ කර තිබීම, දන්ත වෛද්‍ය උපාධි පාඨමාලාවේ BDS අවසන් වසර II වන කොටස සම්පූර්ණ කර තිබීම.
වයස - අවුරුදු 30 ට අඩු විය යුතුය.

(3) <u>ලුතිනන් (පිරිමි/ කාන්තා)</u>

අධ්‍යාපන සුදුසුකම් - වෛද්‍ය/ දන්ත වෛද්‍ය උපාධිය (MBBS/ BDS) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් සහ ශ්‍රී ලංකාවේ වෛද්‍ය සභාවේ නිත්‍ය ලියාපදිංචිය ලබා තිබීම (SLMC).
වයස - අවුරුදු 35 ට අඩු විය යුතුය.

(ඉ) <u>සැපයුම් අංශය (නිත්‍ය නාවික හමුදුව)</u>

නිලය - උප ලුතිනන් (පිරිමි/ කාන්තා)
අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, වාණිජ, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, තක්සේරු යන විෂයයන් සඳහා විශේෂ උපාධියක් ලබා තිබීම.
වයස - අවුරුදු 30 ට අඩු විය යුතුය.

(ඊ) <u>නැව්බඳ ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදුව)</u>

නිලය - ලුතිනන් (පිරිමි)
අධ්‍යාපන සුදුසුකම් - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාවේ අනුමත දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් (යාන්ත්‍රික/ නිෂ්පාදන/ ද්‍රව්‍ය විද්‍යා) ඉංජිනේරු හෝ නාවික නිර්මාණ ශිල්පය පිළිබඳ උපාධියක් ලබා තිබීම.
වයස - අවුරුදු 32 ට අඩු විය යුතුය.

(උ) <u>සිවිල් ඉංජිනේරු (වැඩබිම්) අංශය (නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදුව)</u>

නිලය - ලුතිනන් (පිරිමි)

| | |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම (Bsc in Civil Engineering) හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) මගින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ I හා II කොටසේ (පැරණි විෂය නිර්දේශය) විභාගය හෝ I, II හා III කොටසේ (නව නිර්දේශය) විභාගය සාර්ථකව නිමකර තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) මගින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්. |
| වයස | - අවුරුදු 32 ට අඩු විය යුතුය. |

(ඌ) <u>වාස්තු විද්‍යාඥ අංශය (නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදාව)</u>

| | |
|---|---|
| නිලය | - ලුතිනන් (පිරිමි) |
| අධ්‍යාපන සුදුසුකම් | - ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමන වාස්තු විද්‍යාවේදී උපාධිය (B.Arch) ලබා තිබීම හෝ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනය (SLIA) මගින් පවත්වනු ලබන පළමු සහ දෙවන අදියර වෘත්තීමය පාඨමාල සාර්ථකව හදරා තිබීම හෝ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනය (SLIA) මගින් පිළිගනු ලබන වෙනත් සමාන සුදුසුකම්. |
| වයස | - අවුරුදු 32 ට අඩු විය යුතුය. |

(එ) <u>විධායක අංශය (ස්වේච්ඡා නාවික හමුදාව)</u>

| | |
|---|---|
| නිලය | - වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා) |
| අධ්‍යාපන සුදුසුකම් | - ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම හෝ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) සම්පූර්ණ කර තිබීම සහ රජයේ හෝ පෞද්ගලික අංශයේ පරිපාලන/ විධායක ශ්‍රේණියේ වසරක පළපුරුද්දක් තිබීම හෝ රජය පිළිගත් ආයතනයක උසස් ඩිප්ලෝමාවක් (SLQL 4) සුදුසුකම් සපුරා තිබීම සහ රජයේ හෝ පෞද්ගලික අංශයේ පරිපාලන/ විධායක ශ්‍රේණියේ වසර 02ක පළපුරුද්දක් තිබීම. |
| වයස | - අවුරුදු 30 ට අඩු විය යුතුය. |

3. *අනෙකුත් සුදුසුකම්* .- අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන් ම සපුරාලිය යුතුය.

| | |
|---|---|
| (*අ*) පුරවැසිභාවය | - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| (*ආ*) වයස | - 2017 දෙසැම්බර් 26 වැනි දිනට වයස ඒ ඒ අංශයන් යටතේ දක්වා ඇති පරිදි විය යුතුය. |
| (*ඇ*) උස (නිත්‍ය) - පිරිමි | - සෙමී 168 ට නොඅඩු විය යුතුය. |
| කාන්තා | - සෙමී 160 ට නොඅඩු විය යුතුය. |
| උස (ස්වේච්ඡා) - පිරිමි | - සෙමී 165 ට නොඅඩු විය යුතුය. |
| කාන්තා | - සෙමී 157 ට නොඅඩු විය යුතුය. |
| (*ඈ*) බර (නිත්‍ය/ස්වේච්ඡා) - පිරිමි | - කිග්‍රෑ 52 ට නොඅඩු විය යුතුය. |
| කාන්තා | - කිග්‍රෑ 41 ට නොඅඩු විය යුතුය. |
| (*ඉ*) පපුව (නිත්‍ය/ ස්වේච්ඡා) - පිරිමි | - සෙමී 81 ට නොඅඩු විය යුතුය. |
| (*ඊ*) වර්ණ දෘෂ්ටිය (නිත්‍ය/ ස්වේච්ඡා) | - එස්ටීඩී II. (නිසි පෙනුම) |
| (*උ*) දෘෂ්ටි තීක්ෂණත්වය (නිත්‍ය/ ස්වේච්ඡා) | - වම් ඇස 6/6 දකුණු ඇස 6/6 |
| | - වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරීන් සහ සිසුන් සඳහා දුර දර්ශණය උපැස් රහිතව 6/6 සිට 6/12 දක්වා (උපැස් මගින් 6/6 ලෙස නිවැරදි කර තිබීම). |
| (*ඌ*) සිවිල් තත්වය | - විවාහක/ අවිවාහක |

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා

ඇති මිමිවලට අනුව උස, වයස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවකුගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුවද හමුද සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ ඇය ගැන සලකා බලනු ලැබේ.

6. සේවා කොන්දේසි:

(අ) අපේක්ෂකයින් නිත්‍ය/ ස්වේච්ඡා නාවික හමුදවේ නිලධාරි/ නිලධාරිණී තනතුරු සඳහා බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ. පාඨමාලාවේ කාලය බඳවාගනු ලබන ඒ ඒ අංශය අනුව වෙනස් වේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුවක් ලැබීම සඳහා බඳවාගනු ලබන නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරීන්/ නිලධාරිණියන් සූදනමින් සිටිය යුතුයි.

(ඇ) සියලුම නිලධාරීන්/ නිලධාරිණියන් රාජකාරී හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතුය.

(ඈ) පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන් පසුව නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරීන්/ නිලධාරිණියන් නාවික හමුද නීතියට යටත් විය යුතුයි.

(ඉ) අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළ දී යම් නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරියෙකු/ නිලධාරිණියක හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත්, ශ්‍රී ලංකා ජනරජය මගින් එම නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරියා/ නිලධාරිණිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරියා/ නිලධාරිණිය විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(ඊ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරියෙකු/ නිලධාරිණියක නොමනා හැසිරීම මත හෝ ඔහු/ ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ ඇය අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම්, එම අවස්ථාවේදී ම අදළ නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරියා/ නිලධාරිණිය විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම්, ශ්‍රී ලංකා නාවික හමුදවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමග ගිවිසුමකට හා බැඳුම්කරයට ඇතුළත් විය යුතුයි.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරීන්/ නිලධාරිණියන් හට නිලධාරි නිවාස තුලින් නේවාසික පහසුකම් සහ ආහාර සපයනු ලැබේ.

(ඌ) විවාහක නිලධාරීන්/ නිලධාරිණියන් සඳහා විවාහක නිවස්නයන්හි පවතින පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයන්ට අදළ පරිදි අය කරනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා.-* තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

8. *වැටුප් හා දීමනා :*
2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ.

| *විස්තරය* | *වැඩ බලන උප ලුතිනන්* *රු.* | *උප ලුතිනන්* *රු.* | *ලුතිනන්* *රු.* |
|---|---|---|---|
| මූලික වැටුප | 28,897.00 | 32,807.00 | 38,333.00 |
| ජීවන වියදම් දීමනාව | 7,800.00 | 7,800.00 | 7,800.00 |
| නිළ ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | 255.00 | 255.00 | 255.00 |
| දුෂ්කර ලැගුම් දීමනාව | 600.00 | 600.00 | 600.00 |
| දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| ගැලපුම් දීමනාව | 5,373.00 | 4,715.00 | 3,833.00 |
| ආහාර දීමනාව | 16,138.00 | 16,138.00 | 16,138.00 |
| **එකතුව** | **63,000.00** | **67,240.00** | **71,880.00** |

(අ) ගැලපුම් දීමනාව කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව 2020.01.01 දිනට සම්පූර්ණ වශයෙන් මූලික වැටුපට එකතුවේ.

(ආ) ආහාර දීමනාව ආහාරයෙන් බැහැර නිලධාරින්/ නිලධාරිණියන් සඳහා පමණක් හිමිවේ.

(ඇ) සුදුසුකම් වැටුප අදළ පරිදි මසකට උපරිම රු. 637.50 ක් ගෙවනු ලැබේ.

(ඈ) නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදළ පරිදි නිලධාරියාට/ නිලධාරිණියට, කලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

(ඉ) කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට/ නිලධාරිණියන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(ඊ) නිල ඇඳුම් සහ ඊට අදළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

(උ) නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ. (අදළ පරිදි නිලධාරියාට/ නිලධාරිණියට කලත්‍රයාට දරුවන්ට සහ යැපෙන්නන්ට).

(ඌ) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරින්ට/ නිලධාරිණියට රු. 1,600.00 සිට රු. 4,250.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.

(එ) වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරින් සහ නිලධාරිණියන් හට සෞඛ්‍යය අමාත්‍යාංශයේ අනුමැතිය පරිදි සීමාවාසික පුහුණුවෙන් පසු අමතර රාජකාරි දීමනාව සහ 1/20 දීමනාවන් සඳහා හිමිකම් ඇත.

(ඒ) ඉංජිනේරු නිලධාරින් සඳහා රජයේ අනුමත විශේෂ දීමනාවන් සඳහා හිමිකම් පවතී.

9. අයදුම්කරුවන්ට උපදෙස් :

(අ) පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2017 දෙසැම්බර් මස 26 වැනි දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්), නාවික හමුද මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ 01" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහල කෙලවරේ "ඉඳුරාම බඳවා ගැනීම - නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරින්/ නිලධාරිණියන්" යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-2215154/ 011-2215118 මගින් ලබා ගත හැක.

(ආ) රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගත හොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය.
(2) අයදුම් කර ඇති අංශයන්වලට අදළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන/ උසස් අධ්‍යාපන/ වෘත්තීය අධ්‍යාපන/ උපාධි සහතික.
(3) පාසල් හැරයාමේ සහතිකය/ චරිත සහතිකය.
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය.
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.
(6) මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දනට සේවා යෝජකයාගෙන් විය යුතුය).
(7) ක්‍රීඩා හා ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(ඈ) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

(ඉ) වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතුය.

(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වග කියනු නොලැබේ.

10. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙලිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමටද, තෝරා ගැනීමෙන් පසු හෙලිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමටද යටත් වේ.

11. තෝරා ගැනීමේ/ සම්මුඛ පරීක්ෂණ :-

(අ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. එම පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අපේක්ෂකයින්ට නාවික හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. ඉන් තෝරා ගනු ලබන අපේක්ෂකයින්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

(ආ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා

| වයස් කාණ්ඩය | මීටර් 800 දුර දිවීම | CURL UP (2 MN) | PUSH UP ( 2MN) |
|---|---|---|---|
| 18 - 24 පිරිමි | මිනිත්තු 3.30 - 5.30 අතර | 19 හෝ ඊට වැඩි | 21 හෝ ඊට වැඩි |
| 18 - 24 කාන්තා | මිනිත්තු 4 - 6 අතර | 13 හෝ ඊට වැඩි | 05 හෝ ඊට වැඩි |
| 25 - 29 පිරිමි | මිනිත්තු 4 - 5.30 අතර | 19 හෝ ඊට වැඩි | 20 හෝ ඊට වැඩි |
| 25 - 29 කාන්තා | මිනිත්තු 4.30 - 6.30 අතර | 12 හෝ ඊට වැඩි | 03 හෝ ඊට වැඩි |
| 30 - 34 පිරිමි | මිනිත්තු 4.30 - 6.30 අතර | 15 හෝ ඊට වැඩි | 14 හෝ ඊට වැඩි |
| 30 - 34 කාන්තා | මිනිත්තු 5 - 7 අතර | 09 හෝ ඊට වැඩි | 02 හෝ ඊට වැඩි |
| 35 - 39 පිරිමි | මිනිත්තු 5 - 7 අතර | 13 හෝ ඊට වැඩි | 12 හෝ ඊට වැඩි |
| 35 - 39 කාන්තා | මිනිත්තු 5.30 - 7.30 අතර | 06 හෝ ඊට වැඩි | 02 හෝ ඊට වැඩි |

(ඇ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් එදිනම මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන අතර, එයින් සමත් වන අයදුම්කරුවන් පමණක් දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි. දෙවන සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබන අතර, එම පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක් බඳවාගනු ලැබේ.

(ඈ) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ලිපිනයට ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිඳු වියදමක් ගෙවනු නොලැබේ.

(ඉ) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

(ඊ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(උ) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේය.

(ඌ) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

(එ) වෛද්‍ය/ දන්ත වෛද්‍ය අංශය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් දැනට විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරමින් සිටින අවස්ථාවක දී ඔහු හෝ ඇය තෝරා ගැනීමෙන් පසු නැවත විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා පූර්ණ වැටුප් සහිතව මුදාහරින අතර, මෙහි දී ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා ලෙස ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සමග ගිවිසුමකට එළඹිය යුතුය.

**සටහන -** මෙම *ගැසට් නිවේදනය* සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළ වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

එස්එස් රණසිංහ, ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී, ඒම්ඩබ්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති,

නාවික හමුද මූලස්ථානය,
තැ. පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරින්/ නිලධාරිණියන් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. ඉල්ලුම් කරන අංශය සහ තනතුර :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. විද්‍යුත් ලිපිනය :————.

8. උපන් දිනය :————.

9. වයස ඃ අවුරුදු :————. මාස :————. දින :————. (2017 දෙසැම්බර් 26 වැනි දිනට)

10. උස ........... (සෙ.මී) පපුව ................. (සෙ.මී) බර ............. (කි.ග්‍රෑ)

11. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

12. දිස්ත්‍රික්කය :————.

13. ඡන්ද කොට්ඨාසය :————.

14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

15. දුරකථන අංකය :————.

16. විවාහක හෝ අවිවාහක බව:————.

17. ස්ත්‍රී පුරුෂ භාවය :————.

18. අධ්‍යාපනය ලැබූ පාසල :————.

19. පාසල සහ විශ්වවිද්‍යාලය පිළිබඳ විස්තර :

| පාසලේ / විශ්වවිද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ)<br>අ.පො.ස. (උ.පෙළ)<br>වෙනත් | | |

20. පාසලෙන්/ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා<br>මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගි වූ තරග හා ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න) :————.

24. පාසලේදී, විශ්වවිද්‍යාලයේදී හෝ බාහිර සංවිධානවලදී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න. :————.

25. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :————.

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුද කිසිවකට හෝ පොලිසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

27. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේ ද? එසේනම් විස්තර සඳහන් කරන්න :————.

28. රජයේ දෙපාර්තමේන්තුවක දී හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකුව, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුලුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

29. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

30. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :
පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාලවන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11 - 882

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

### නීති නිලධාරී (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ නීති නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබයි.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

02. **අවශ්‍ය සුදුසුකම් :**

2.1 *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

2.2 *පළපුරුද්ද :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛන වල පළපුරුද්ද ලබාගත් කාලය, දිනය හා නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළයුතුය.)

2.3 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

2.4 *වෙනත් :*

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මේ සඳහා අයදුම්කිරීමට සුදුසුකම් නොලබයි.
- අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළ කරනු ලබන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.)

03. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

(i) මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. නීති නිලධාරී III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම, තනතුරට බැඳී වසර 05ක් ඇතුළත ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

04. **වයස් සීමාව :**
ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

05. **වැටුප් පරිමාණය :**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 දරන චක්‍රලේඛයට අනුව SL-1-2016, රු. 47,615-10x1335-8x1,630-17x2,170-රු.1,10,895 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. (ඔබට වැටුප් ගෙවනු ලබන්නේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.)

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | *අතිරේක අධ්‍යාපන සුදුසුකම් :*<br>පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය,<br>* පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>* දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>* දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා<br><br>නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br><br>නීති විද්‍යාලයේ අවසන් වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා<br>***සටහන*** : ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ලබාදිය යුතු යි.<br>(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දේ. - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | <br><br>20<br>15<br>10<br><br>15<br><br>10 | 20 |
| 02 | *අතිරේක වෘත්තීය සුදුසුකම් :*<br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03 කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>(එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | 15 |
| 03 | *අතිරේක පළපුරුද්ද :*<br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද -<br>මාස 06 කට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br>එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක්<br>(මූලික සුදුසුකම් ලබාගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර)<br><br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය.) | | 30 |
| 04 | *ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව :*<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/ පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය<br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය.)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(වසර 01ක් හෝ පැය 1500)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා :<br>මාස 06/පැය 720<br>මාස03/පැය 360<br>(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදේ) | <br>15<br><br><br><br>10<br><br><br><br><br><br>07<br>05 | 15 |

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 05 | *තොරතුරු තාක්‍ෂණය පිළිබඳ දැනුම*<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදරා තිබීම සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා :<br>මාස06/පැය 720<br>මාස 03/ පැය 360<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ) | 15<br><br><br>10<br><br><br>07<br>05 | 15 |
| 06 | *සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව* | | 05 |
| | *මුළු එකතුව* | | 100 |

07. *අපේක්‍ෂකයින්ගේ අනන්‍යතාවය :*

7.1 ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්‍ෂකයින් පමණි.

7.2 සම්මුඛ පරීක්‍ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කල යුතුය.

7.3 සම්මුඛ පරීක්‍ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(*අ*) අයදුම්පත් 2017.12.18 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
නීතිය හා සාමය සහ දක්‍ෂිණ සංවර්ධන අමාත්‍යාංශය,
14 වන මහල,
සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර මාවත,
බත්තරමුල්ල.

(*ආ*) ඉදිරිපත් කල යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රය මෙම නිවේදනය අවසානයේ www.lawandorder.lk අමාත්‍යාංශ වෙබ් අඩවියේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 05 දක්වාත් දෙවන පිටුව 06 සිට 09 දක්වාත් තෙවන පිටුව අංක 10 සිට 12 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින්ම සම්පූර්ණ කල යුතුය.

(*ඇ*) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ ''නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම'' යනුවෙන් සඳහන් කල යුතුය.

(*ඈ*) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු. 47,615 මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කල යුතුය.

(*ඉ*) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය.

(*ඊ*) මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට

පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවාගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන
අමාත්‍යාංශය,

14 වන මහල,
සුහුරුපාය,
ශ්‍රී සුභූතිපුර මාවත,
බත්තරමුල්ල.

### *ආදර්ශ අයදුම්පත්‍රය*

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම (විවෘත)

| | |
|---|---|
| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල - 2/දෙමළ - 3)

01. (i) මුලකුරු අගට යොදු මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : GUNAWARDHANA, M. G. B. S. K.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(iii) මුලකුරු සමග නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)
(iv) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02 (i) සම්පූර්ණ ලිපිනය :————.
(ii) ස්ථිර පදිංචි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(iii) තාවකාලික පදිංචි ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(iv) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(v) දුරකථන අංකය :————.

03. ස්ත්‍රී/ පුරුෂ භාවය :

ස්ත්‍රී - 1,
පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. විවාහක/ අවිවාහක බව :

විවාහක - 1
අවිවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. උපන් දිනය :

වර්ෂය : ☐ මාසය : ☐ දිනය : ☐

2017.12.18
දිනට වයස : වර්ෂ : ☐ මාස : ☐ දින : ☐

06. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

07. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට කැඳවීමේ නිවේදනයට අනුව ලබාගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තරය. :

| සුදුසුකම ලබාගත් ආයතනය | ලබාගත් දිනය |
|---|---|
| ..................... | ..................... |
| ..................... | ..................... |
| ..................... | ..................... |
| ..................... | ..................... |
| ..................... | ..................... |

08. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

09. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර. :

| | *සුදුසුකම් ලබාගත් ආයතනය* | *ලබාගත් දිනය* |
|---|---|---|

01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| | | |
|---|---|---|
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |

02. අතිරේක වෘත්තීය සුදුසුකම් :

| | | |
|---|---|---|
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |

| | *සුදුසුකම් ලබාගත් ආයතනය* | *ලබාගත් දිනය* |
|---|---|---|

03. අතිරේක පළපුරුද්ද :

| | | |
|---|---|---|
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |

04. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව :

| | | |
|---|---|---|
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |

05. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :

| | | |
|---|---|---|
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |
| .................. | .................. | .................. |

10. අයදුම්කරුගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත්, තොරතුරු බව සහතික කරන අතර සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන සියලු විධිවිධානයන්ට මම යටත් වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

ඉහත නම සඳහන් ........................................ මහතා/ මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම :————.

තනතුර :————.

දිනය :————.

12. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත විස්තර සඳහන් ............................... මහතා /මහත්මිය/ මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, මෙම තනතුර සඳහා තොරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාව යොදන්න.)

11-1104

---

## ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම - 2017
### විවෘත අංශය

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති බන්ධනාගාර නියාමක හා කාන්තා නියාමක තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/ පුරුෂ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *පුරප්පාඩු සංඛ්‍යාව සහ පුරප්පාඩු පිරවීම* :

2.1 පුරප්පාඩු වී ඇති බන්ධනාගාර නියාමක (පිරිමි) තනතුරු ගණන එක්දහස් හැට අටක් (1068) හා (කාන්තා) තනතුරු ගණන එකසිය දහසය (116) ක් වේ. මෙම පුරප්පාඩුවලින් සියයට අනූපහ (95%) ක් විවෘත අංශයෙන් ද, සියයට පහ (5%) ක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙහි සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින් ද පුරවනු ලැබේ.

2.2 සියලුම පුරප්පාඩු පිරවීමට හෝ කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

03. *තනතුරෙහි කාර්ය භාරය* :

බන්ධනාගාර ආයතනයන්හි පරිපාලනයට සහාය වීම සහ බන්ධනාගාරගත නේවාසිකයන්ගේ ආරක්ෂාව සැලසීම සහ ඔවුන් ආරක්ෂණය කිරීමට සහාය වීම.

04. *වැටුප් ක්‍රමය* :

රු. 29,540 - 300 x 7 - 370 **x** 27 - රු. 41630 (RS. 1 - 2016) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016) හි විධිවිධාන අනුව වැටුප් ගෙවනු ලැබේ.
ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මාසිකව රාජකාරි කිරීම අනුව විශේෂ දීමනා උපයාගත හැක.

05. *අවශ්‍ය සුදුසුකම්* :

(*අ*) වයස් සීමාව : *ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු දහඅටට (18) නොඅඩු සහ අවුරුදු තිහට (30) නොවැඩි විය යුතු ය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :
අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයයන් 02 කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් සමත් විය යුතු ය.

(ඇ) *කායික සුදුසුකම්* :

පිරිමි අයදුම්කරුවන් -
(i) උස - අවම උස අඩි පහයි (05) අඟල් හතරක් (04) විය යුතු ය.
(ii) පපුව - හුස්ම නාල්ලා පපුව අඟල් තිස්දෙකක් (32) විය යුතු ය.

කාන්තා අයදුම්කරුවන් -
(i) උස - අවම උස අඩි පහයි (05) අඟල් දෙකක් (02) විය යුතු ය.

(ඈ) වෙනත් සුදුසුකම් :
(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
(ii) මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් ද යුක්ත අයවලුන් විය යුතු ය.
(iii) චරිත දූෂණයට අදළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේ ය.
(iv) තනතුරට බඳවා ගැනීම සඳහා ඉහත (අ) සිට (ඈ) දක්වා වන සුදුසුකම් අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනය වන විට සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය* :

අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමට සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර, මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් එදිනම පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

(i) මීටර් 1000 දුර දිවීම - මිනිත්තු 03 තත්පර 44 තුළ නිම කළ යුතු ය. (පිරිමි අයදුම්කරුවන් සඳහා)
(ii) කාන්තා අයදුම්කරුවන් සඳහා ද පරීක්ෂණයක් පැවැත්වේ.

යෝග්‍යතා පරීක්ෂණයෙන් *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ . ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බන්ධනාගාර නියාමක තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :

| *අනු. අංකය* | *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | 25 |
| 02 | වෘත්තීය සුදුසුකම් | 15 |
| 03 | ක්‍රීඩා කෞශල්‍යය | 30 |
| 04 | නායකත්වය හා ප්‍රජා සේවාවන් | 25 |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 |
| | එකතුව | 100 |

08. *ව්‍යාජ තොරතුරු සැපයීම* :

ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. සාවද්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් පරීක්ෂණයට පෙර හෝ පරීක්ෂණය පැවැත්වෙද් දී හෝ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක පත්වීම් බලධරයා විසින් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු / ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පුළුවන.

09. *පත්වීමේ කොන්දේසි* :

මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

10. සේවා කොන්දේසි :

(*අ*) පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වනු ඇත.

(*ආ*) පත්වීම ලැබ වසර 03 ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය.

(*ඇ*) රාජ්‍ය සේවයෙහි පත්වීම පාලනය කරනු ලබන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/EST - 02- 01- 18/02/2014 හා 2014.11.20 හා දිනැති ලිපියෙන් බන්ධනාගාර නියාමක තනතුර සඳහා අනුමත බඳවා ගැනීම් පරිපාටියෙහි විධිවිධානයන් හා ඊට කරන ලද හා මින් මතු කිරීමට නියමිත සංශෝධනයන්ට යටත්ව බන්ධනාගාර නියාමක තනතුරට පත්වීම් ලබා දෙනු ලැබේ.

(*ඈ*) බන්ධනාගාර නියාමක තනතුරට පත්වීම් ලබන්නන් දිවයිනේ ඕනෑම බන්ධනාගාර ආයතනයක සේවයෙහි

යෙදීමට බැඳී සිටින අතර, පුහුණුවෙන් පසු වසර 10 ක කාලයක් අනිවාර්යයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදෙන බවට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු ය. පුහුණු කාලය තුළ පුහුණුව හැර යන හෝ පුහුණුවෙන් පසු ගිවිසුම් ප්‍රකාර නියමිත සේවා කාලයට පෙර තනතුර අතහැර යන නිලධාරීන් පුහුණුවට අදළ සියළු වියදම් සහ අනෙකුත් වියදම් දෙපාර්තමේන්තුවට ගෙවීමට බැඳී සිටිය යුතු ය.

(ඉ) බන්ධනාගාර නියාමක තනතුරට පත්වීම් ලබන්නන් දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන තනිකඩ නිල නිවාසවල අවම වශයෙන් වසර 05 ක් නතර වී සේවය කළ යුතු ය.

11. *තෝරා ගැනීමේ පරිපාටිය* :

(අ) ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බන්ධනාගාර නියාමක තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

12. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2014.01.21 වැනි දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව, සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

13. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

13.1 ඉල්ලුම්පත සැකසීම

13.1.1. මෙම නිවේදනයට අමුණා ඇති ඉල්ලුම්පත් ආකෘතිය අනුව ඉල්ලුම්පත සැකසිය යුතු ය. එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වේ.

13.1.2. සාමාන්‍ය ඡායා පිටපත් (21 x 29 cm / 8.5” x 12”/A4) කඩදාසියෙහි දෙපැත්තම භාවිතා කරමින් අයදුම්පත සකස් කළ යුතු ය.

13.2 ඉල්ලුම්පත සම්පූර්ණ කිරීම

13.2.1. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරීවරයෙකු, පොලිස් සේවයේ ගැසට්කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 2,40,360.00 ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය. රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ආයතන ප්‍රධානියා විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

13.2.2 නියමිත ආදර්ශ ආකෘතියට අදළ නොවන, අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය.

13.3 *ඉල්ලුම්පත යොමු කිරීම* :

13.3.1. අයදුම්පත්‍රය බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීමේ පරීක්ෂණය - 2017" යන්න සඳහන් කළ යුතු ය.

13.3.2. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2017.12.18 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයට පෙනී සිටීමට පහසු බන්ධනාගාරයේ අධිකාරිවරයා වෙත ඔහුගේ රාජකාරි ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතු ය. බන්ධනාගාර ආයතනයන්හි ලිපිනයන් ලැයිස්තුව සඳහා I උපලේඛනය බලන්න. **බන්ධනාගාර මූලස්ථානය වෙත හෝ I වන උපලේඛනයේ සඳහන් නොවන වෙනත් ආයතන වෙත යොමු කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

13.3.3. තැපැල් කිරීමේ දී නැතිවීම හෝ 2017.12.18 වැනි දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිබඳව කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියළු අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු නීතිරීති සහ මෙම නිවේදනයේ අඩංගු කොන්දේසි අනුව කටයුතු කිරීමට බැඳී සිටී.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

*සටහන*.-පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

එච්. එම්. එන්. සී. ධනසිංහ,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 12 වැනි දින,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150,
බේස්ලයින් පාර,
කොළඹ 09.

*උපලේඛනය **I***

| *අනු. අංකය* | *දිස්ත්‍රික්කය* | *බන්ධනාගාර ආයතනය* | *බන්ධනාගාර ආයතනයේ ලිපිනය* |
|---|---|---|---|
| 01 | කොළඹ | බන්ධනාගාර පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය - බේස්ලයින් පාර, කොළඹ 09 | සහකාර බන්ධනාගාර අධිකාරි, පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය - බේස්ලයින් පාර, කොළඹ 09. |
| 02 | ගම්පහ | මහර බන්ධනාගාරය | බන්ධනාගාර අධිකාරි,<br>මහර බන්ධනාගාරය,<br>රාගම. |
| 03 | කළුතර | කළුතර බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>කළුතර බන්ධනාගාරය,<br>කළුතර. |
| 04 | මාතලේ | පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුර | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුර,<br>පල්ලෙකැලේ, කුණ්ඩසාලේ. |
| 05 | මහනුවර | බෝගම්බර බන්ධනාගාරය | බන්ධනාගාර අධිකාරි,<br>බෝගම්බර බන්ධනාගාරය,<br>දුම්බර, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ. |
| 06 | නුවරඑළිය | තල්දෙන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>තල්දෙන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය, තල්දෙන. |
| 07 | ගාල්ල | ගාල්ල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>ගාල්ල බන්ධනාගාරය,<br>ගාල්ල. |
| 08 | මාතර | මාතර බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>මාතර බන්ධනාගාරය,<br>මාතර. |
| 09 | හම්බන්තොට | තංගල්ල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>තංගල්ල බන්ධනාගාරය,<br>තංගල්ල. |
| 10 | යාපනය | යාපනය රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>යාපනය රිමාන්ඩ් බන්ධනාගාරය,<br>යාපනය. |
| 11 | මුලතිව් | වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය,<br>වවුනියාව. |
| 12 | කිළිනොච්චිය | වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය,<br>වවුනියාව. |
| 13 | වවුනියාව | වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය,<br>වවුනියාව |
| 14 | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>ත්‍රිකුණාමලය රිමාන්ඩ් බන්ධනාගාරය,<br>ත්‍රිකුණාමලය. |
| 15 | මඩකලපුව | මඩකලපුව බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>මඩකලපුව බන්ධනාගාරය,<br>මඩකලපුව. |

| *අනු අංකය.* | *දිස්ත්‍රික්කය* | *බන්ධනාගාර ආයතනය* | *බන්ධනාගාර ආයතනයේ ලිපිනය* |
|---|---|---|---|
| 16 | අම්පාර | මොණරාගල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>මොණරාගල බන්ධනාගාරය,<br>මොණරාගල. |
| 17 | පුත්තලම | මීගමුව බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>මීගමුව බන්ධනාගාරය,<br>මීගමුව. |
| 18 | කුරුණෑගල | වාරියපොල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>වාරියපොල බන්ධනාගාරය,<br>වාරියපොල |
| 19 | අනුරාධපුරය | අනුරාධපුර බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>අනුරාධපුරය බන්ධනාගාරය,<br>අනුරාධපුරය. |
| 20 | පොළොන්නරුව | පොළොන්නරුව රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>පොළොන්නරුව රිමාන්ඩ් බන්ධනාගාරය,<br>පොළොන්නරුව. |
| 21 | බදුල්ල | බදුල්ල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>බදුල්ල බන්ධනාගාරය,<br>බදුල්ල. |
| 22 | මොණරාගල | මොණරාගල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>මොණරාගල බන්ධනාගාරය,<br>මොණරාගල |
| 23 | කෑගල්ල | කෑගල්ල බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>කෑගල්ල රිමාන්ඩ් බන්ධනාගාරය,<br>කෑගල්ල. |
| 24 | රත්නපුරය | කුරුවිට බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>කුරුවිට බන්ධනාගාරය,<br>කුරුවිට. |
| 25 | මන්නාරම | වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය | සහකාර බන්ධනාගාර අධිකාරි,<br>වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරය,<br>වවුනියාව. |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

***ආදර්ශ අයදුම්පත්‍රය***

*ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාර නියාමක තනතුරට බඳවා ගැනීම - 2017*

විවෘත අංශය

01. (*අ*) මුලකුරු අගට යොද මුලකුරු සමග නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : (GUNAWARDHANA, M. G. B. S. K.)

(*ආ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(*ඇ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

02. (*අ*) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.

(*ආ*) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

(*ඇ*) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය සහ දිස්ත්‍රික්කය :—————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය : ☐

ස්ත්‍රී - 1, පුරුෂ 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. විවාහක/ අවිවාහක බව : ☐

අවිවාහක - 1
විවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

07. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස (2017.12.18)

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

08. පුරවැසිභාවය (පරම්පරාවෙන් ද / ලියාපදිංචි කිරීමෙන් ද යන වග) :————.

09. දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

10. ශාරීරික මිනුම් :
උස : අඩි :———. අඟල් :———.
පපුව : අඟල් :———.

(කාන්තා අයදුම්කරුවන් උස පමණක් ඇතුළත් කළ යුතු ය)

11. *අධ්‍යාපන සුදුසුකම්* :

අ.පො.ස. (සා.පෙළ) - පළමුවර

(i) විභාගයේ වර්ෂය :______ .
(ii) විභාග අංකය :______ .
(iii) විභාග ප්‍රතිඵල :

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (සා.පෙළ) - දෙවන වර

(i) විභාගයේ වර්ෂය :______ .
(ii) විභාග අංකය :______ .
(iii) විභාග ප්‍රතිඵල :

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

12. වෙනත් සුදුසුකම් :—————.

13. කිසියම් වරදක් සම්බන්ධයෙන් ඔබ උසාවියේ වරදකරු වී ඇත්නම් ඒ හා සම්බන්ධ සියලුම විස්තර :—————.

14. *අයදුම්කරුගේ සහතිකය* :

I. මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ නිවැරදි ලෙස සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

II. මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමටත් යටත්වන බව මම දනිමි.

III. අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සියලු කරුණු ඉතා හොඳින් කියවා අවබෝධ කරගත් බවත්, එහි සඳහන් සියලු කරුණු හා කොන්දේසිවලට එකඟවන බවත් ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :—————.

15. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................... මයා/ මිය/ මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ ඇය මා ඉදිරිපිට දී ........................ දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

—————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
දිනය :—————.

(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

16. දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියාගේ සහතිකය :

........................ මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවයේ නියුතු බව ද, ඔහුගේ/ ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදයක බව ද, මෙම තනතුරට අදාළ නිවේදනයේ පරිදි මෙම තනතුරට අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති බව ද, ඔහු/ඇය තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.
(අදාළ නොවන වචන කපා හරින්න)

—————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
දිනය :—————.

(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

11-1158

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - රත්මලාන**

***පාඨමාලා සඳහා බඳවා ගැනීම - 2018***

| *පූර්ණ කාලීන පාඨමාලා* | NVQ මට්ටම | කාලය (මාස) | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| 1. යන්ත්‍රන ශිල්පී - Machinist (General) | NVQ 04 | 12 | අ. පො. ස. (සා. පෙළ) විෂයන් 06කින් සමත්වීම. |
| 2. විදුලි කාර්මික ශිල්පී (කර්මාන්ත) Electrician (Industrial) | NVQ 04 | 12 | |
| 3. ශීතකරණ හා වායුසමීකරණ ශිල්පී - Ref and Air conditioning Mechanic | NVQ 04 | 12 | |
| 4. මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී - Automobile Electrician | NVQ 04 | 12 | |
| 5. සැලසුම් ශිල්පී - Draughts person | NVQ 04 | 12 | |
| 6. ග්‍රැෆික් නිර්මාණ ශිල්පී - Computer Graphic Designer | NVQ 04 | 06 | |
| 7. පරිගණක දෘඩාංග ශිල්පී - Computer Hardware Technician | NVQ 04 | 06 | |
| 8. තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී Information & Communication Technology Technician | NVQ 04 | 06 | ගණිතය, ඉංග්‍රීසි සම්මාන සහිතව අ. පො. ස. (සා.පෙළ) විෂයන් 06කින් සමත්වීම |
| 9. ගුවන් විදුලි, රූපවාහිනී හා ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කාර්මික ශිල්පී - Radio, TV Allied Equipment Repairer | NVQ 04 | 18 | අ. පො. ස. (සා. පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06කින් සමත්වීම |
| 10. වායුපීඩන තාක්ෂණ ශිල්පී - Pneumatic Technician | NVQ 04 | 12 | |
| 11. ඉදිකිරීම් ශිල්පී - Construction Technician | NVQ 04 | 12 | 9 වසර සමත් |
| 12. වඩු කාර්මික ශිල්පී - (ගොඩනැගිලි) Wood Craftsman | NVQ 04 | 12 | අ. පො. ස. (සා. පෙළ) පෙනී සිටීම |
| 13. ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පී - Aluminum Fabricator | NVQ 04 | 06 | |
| 14. උද්‍යාන අලංකරණ ශිල්පී - Landscaping | NVQ 04 | 06 | 9 වසර සමත්වීම |
| 15. මෝටර් රථ වැද්දුම් ශිල්පී - Automobile Tinker | NVQ 04 | 06 | |
| 16. මෝටර් රථ පින්තාරු ශිල්පී - Automobile Painter | NVQ 04 | 06 | |
| 17. පෑස්සුම් ශිල්පී - Welder | NVQ 04 | 12 | අ. පො. ස. (සා. පෙළ) විෂයන් 03කින් සමත්වීම |
| 18. ප්‍රමාණ සමීක්‍ෂණ ඩිප්ලෝමා - Diploma in Quantity Surveyor | NVQ 05 | 12 | ගණිතය/විද්‍යා/තාක්ෂණවේදය අංශයෙන් අ. පො. ස. (උ. පෙළ) විෂයයන් 03 ක් සමත්වීම හෝ NVQ 4 සහතිකය ලබා තිබීම. |

* පාඨමාලා සඳහා කිසිදු අය කිරීමක් නොමැත.

* සෑම වසරකම ජනවාරි මස සහ ජූලි මස මුල් සතිය තුළ නව පාඨමාලා ආරම්භ කෙරේ.

අපෙන් ඔබට. . . . . .

- NVQ මගින් තාක්‍ෂණ උපාධිය සඳහා ප්‍රවේශවීමේ අවස්ථාව
- ස්වයං රැකියා සඳහා රු. 500000 දක්වා ණය පහසුකම්
- දෙස් විදෙස් රැකියා අවස්ථා
- වෘත්තීය උපදේශන සේවාවන්
- නේවාසික පහසුකම්
- වෘත්තිය ඉංග්‍රීසි දැනුම/ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- නායකත්ව පුහුණුව
- මූලික පරිගණක දැනුම
- ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන්
- 11 හා 12 පාඨමාලා සඳහා මාසිකව ආධුනික දීමනා
- ප්‍රවාහන පහසුකම්

දැනටමත් ක්ෂේත්‍රයේ නියුතු ඔබට අපෙන් . . . . .
- RPL මගින් NVQ සහතිකයක්

*පාඨමාලාව සඳහා යොමු වීම :*
ඔබ විසින් සකස් කරගත් අයදුම්පතක් (නම, ලිපිනය, දුරකථන අංකය, කැමති පාඨමාලාව (පූර්ණ කාලීන/අර්ධ කාලීන) අධ්‍යාපන සුදුසුකම් ඇතුළත්ව 2017.12.29 දිනට පෙර යොමු කරන්න.

*අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :*
සහකාර අධ්‍යක්‍ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 100, කඳවල පාර, රත්මලාන.
විමසීම් : 011 2638850, 0719476747, 0710318736
ඊමේල් : nvtirathmalana@vtasl.gov.lk

- දෙසැම්බර් 06, 13, 20, 27 සහ 29 දිනයන් හි සම්මුඛ පරීක්‍ෂණ
- ප්‍රථමයෙන් ලැබෙන අයදුම්පත් සඳහා ප්‍රමුඛතාවය

- *අර්ධ කාලීන පාඨමාලා : (පැය 100)*

* විදුලි කාර්මික * ඇළුමිනියම් පිරිසැකසුම් * පරිගණක * සැලසුම් ශිල්පී * මෝටර්රථ කාර්මික.

සුනිල් අබේසිංහ,
සහකාර අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
අංක 100, කඳවල පාර,
රත්මලාන.

11-735

---

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

**මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුරුවලට හා රසායනාගාර සහකාර තනතුරු සඳහා පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2017**

Limited Competitive Examination for the Recruitment to theTrainee Grade of the Posts of Inspectors of Measurement Services Devices and Lab Assistant of the Sri Lanka Technological Service of Department of Measurement Units Standards and Services -2017

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III පන්තියේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුරු හා රසායනාගාර සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමට ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කොළඹදී පමණක් පැවැත්වෙන අතර මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කල ඉල්ලුම් පත්‍ර 2017.12.18 වන දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල**"යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර/ රසායනාගාර සහකාර තනතුර සඳහා වන සීමිත තරග විභාගය - 2017" යන්න සඳහන් කළ යුතුය.

01. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවුරුදු දෙකක පුහුණු කාල සීමාවකට යටත් වේ.

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාලය තුළදී ලබාගත යුතුය.

(iv) තනතුරෙහි III වන පන්තියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉමද, II වන පන්තියට පත්වී වසර 03 ක් ගතවීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉමද, I වන පන්තියට පත්වී වසර 05 ක් ගතවීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉමද සමත් විය යුතුය.

02. *වැටුප් හා දීමනා :*

අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස සුදුසුකම් ලැබූ නිලධාරීන් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් දැරූ වැටුප් ප්‍රමාණයේම තව දුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන නිපුණතා පරීක්ෂණය සමත්වන තුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු ශ්‍රේණියේ සතුටුදායක ලෙස ගත කරන නිලධාරියෙකුට දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේ ඊළඟ වර්ධකය ලබාදෙන අතර දීමනාව තව දුරටත් ගෙවනු ලැබේ. විභාගය සතුටුදායක ලෙස සම්පූර්ණ කල විට ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැටුප් පරිවර්තනය කෙරේ.

- තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක/ රසායනාගාර සහකාර

1 වන වසර - රු. 15,924.00 ක මාසික දීමනාවක්

2 වන වසර - රු.16,100.00ක මාසික දීමනාවක්

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 යටතේ MN 3-2016 රු. 31,040 -10x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550.00 වන අතර එම වැටුප හිමිවන්නේ 2020.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

03. *අධ්‍යාපනික සුදුසුකම් :*

(i) මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර /රසායනාගාර සහකාර තනතුර

භාෂාව, ගණිතය, විද්‍යාව යන විෂයනට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් 06 කින් සමත් වීම.

වෘත්තීය සුදුසුකම් - අදාළ නොවේ.

04. *පළපුරුද්ද :*

(i) මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර :

කිරුම් මිනුම් යාන්ත්‍රික ශිල්පියකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද හෝ කාර්මික ශිල්පියකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද හෝ මිනුම් ප්‍රමිති සේවා සහායකයකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද

(ii) රසායනාගාර සහකාර තනතුර :

කිරුම් මිනුම් යාන්ත්‍රික ශිල්පියකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද හෝ කාර්මික ශිල්පියකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද හෝ මිනුම් ප්‍රමිති සේවා සහායකයකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද හෝ රසායනාගාර සහායකයකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද

05. *වෙනත් සුදුසුකම් :*

(i) නියමිත දිනට පූර්වාසන්න වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ii) තනතුර ස්ථිර කර තිබීම

(iii) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් හෙබි අයෙකු විය යුතුය.

(iv). අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර තිබිය යුතුය.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සීමිත තරග විභාගයෙන් සමත් විය යුතුය.

පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරාගනු ලබන අයදුම්කරුවන් දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව අවසානයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන නිපුණතා පරීක්ෂණය සමත්විය යුතුය. නිපුණතා පරීක්ෂණය සමත් වන නිලධාරීන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III වන පන්තියට බඳවා ගනු ලැබේ.

මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | කාලය |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්‍ෂණය | 100 | 40% | පැය 01 |
| 02. තාක්‍ෂණය හා විෂයානුබද්ධ පරීක්‍ෂණය (මිනුම් සේවා හා උපක්‍රම පරීක්‍ෂක) | 100 | 40% | පැය 01 |

රසායනාගාර සහකාර තනතුර ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | කාලය |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්‍ෂණය | 100 | 40% | පැය 01 |
| 02. තාක්‍ෂණය හා විෂයානුබද්ධ පරීක්‍ෂණය (රසායනාගාර සහකාර) | 100 | 40% | පැය 01 |

එක් එක් විෂයකින් සමත්වීම සඳහා 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රතිශතයක් ලබාගත යුතුය. මුළු ලකුණුවල කුසලතාවේ අනුපිළිවෙලට අනුව එක් එක් තනතුරට බඳවා ගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල ලේඛණයක් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු නොලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තාවූත්, විෂයයන් දෙකින්ම උපරිම මුළු ලකුණු ලබාගත්තාවූත් අපේක්ෂකයන් පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් කෙරේ. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ්අඩවියේ පළකිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලැබේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

07. *ලිඛිත විභාගය* :
විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලු ප්‍රශ්න පත්‍රවලට ඉල්ලුම් කළ මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය.

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. බුද්ධි පරීක්ෂණය තනතුරු දෙකම සඳහා පොදු වන අතර අපේක්ෂකයන් විසින් එක් එක් තනතුරට අදාළව තාක්ෂණික ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය.

i. මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක

- *බුද්ධි පරීක්ෂණය* -
  කාලය පැය 01 කි. මුළු ලකුණු 100 කි. අපේක්ෂකයාගේ තර්කානුකූලතාව, සිතීමේ හැකියාව, විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්තවන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
- *තාක්ෂණය හා විෂයානුබද්ධ පරීක්ෂණය* - කාලය පැය 1 කි. මුළු ලකුණු 100 කි.
- පඩි, මිම් සහ කිරුම් මිනුම් උපකරණ පිළිබඳ මූලික දැනුම [(අ) මූලධර්ම, (ආ) ක්‍රියාකාරිත්වය, (ඇ) ප්‍රායෝගික භාවිතය, (ඇ) ඒ හා සම්බන්ධ දෙපාර්තමේන්තු රෙගුලාසි ]

- මිනුම් ඒකක පිළිබඳ මූලික දැනුම [(අ)ජාත්‍යන්තර සම්මත ඒකක (SI Units), (ආ) ව්‍යුත්පන්න ඒකක, (ඇ) විවිධ රාශීන් මැනීම සඳහා භාවිත කරනු ලබන ඒකක]

ii. රසායනාගාර සහකාර :

*බුද්ධි පරීක්ෂණය* -

කාලය පැය 01 කි. මුළු ලකුණු 100 කි. අපේක්ෂකයාගේ තර්කානුකූලතාව, සිතීමේ හැකියාව, විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්තවන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*තාක්ෂණය හා විෂයානුබද්ධ පරීක්ෂණය* - කාලය පැය 1 කි. මුළු ලකුණු 100 කි.

- ජාතික මිනුම් පර්යේෂණාගාරයේ භාවිතවන උපකරණ පිළිබඳ දැනුම [(අ) මූලධර්ම, (ආ) ක්‍රියාකාරීත්වය, (ඇ) ප්‍රායෝගික භාවිතය, (ඈ) එම උපකරණ භාවිතා කරන ක්‍රමවේදය හා නඩත්තු]
- මිනුම් ඒකක පිළිබඳ මූලික දැනුම [(අ)ජාත්‍යන්තර සම්මත ඒකක, (ආ) ව්‍යුත්පන්න ඒකක, (ඇ) විවිධ රාශීන් මැනීම සඳහා භාවිත කරනු ලබන ඒකක]
- පර්යේෂණාගාරයේ පවත්වාගෙන යා යුතු පාරිසරික තත්ව පිළිබඳ දැනුම [ (අ) උෂ්ණත්වය, (ආ) සාපේක්ෂ ආර්ද්‍රතාවය, (ඇ) වාතයේ ගුණාත්මකභාවය ]

08. අයදුම්පත්‍ර හා අයදුම් කරන ආකාරය :

ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 09 දක්වා පළමුවන පිටුවට ද, 10 සිට 15 දක්වා දෙවන පිටුවට ද, ඉතිරිය තෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් කර ඇති ඉල්ලුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ඉල්ලුම්කරුට ප්‍රයෝජනවත් විය හැක. තව ද ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රයේ සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වන අතර ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.අයදුම්කරුගේ මනාපය මත සුදුසුකම් ඇත්නම් තනතුරු දෙක සඳහාම අයදුම් කළහැක.තනතුරු දෙක සඳහාම පත්වීම සඳහා සුදුසුකම් ලැබුවහොත් ඔබ පත්වීමට ඇති කැමැත්ත අනුව පළමු කැමැත්ත සඳහා අංක ද, දෙවන කැමැත්ත සඳහා අංක 2 ද, වශයෙන් අයදුම්පතේ සඳහන් කළ යුතුය.අයදුම්පත්‍ර ලැබුණු බව අපේක්ෂකයන් වෙත දන්වනු නොලැබේ.

09. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, නියමිත විභාග ගාස්තු ගෙවා,නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම් පත්‍රයේ පිටපත ද, විභාග ගාස්තු ගෙවීමේදී ලද කුවිතාන්සියේ පිටපත ද, ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට ඔබගේ ෆැක්ස් අංකයක්ද සමග ඉහත ඔබගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් විමසා සිටීම ද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

10. අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය.කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු / විශ්‍රාම නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

11. එක් තනතුරක් සඳහා විභාග ගාස්තුව රු. 1000.00 ක් වන අතර, තනතුරු දෙකම සඳහා අයදුම් කරන අයදුම්කරුවන් සඳහා එය රු. 1300.00 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්, උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත,එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය.විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරන අතර, ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී අපේක්ෂකයන්ගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවන අතර මෙම නිවේදනය තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට හා අදාළ බඳවාගැනීම් පටිපාටියෙහි ඇතුළත් විධිවිධාන වලට යටත් වේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එස්. එන්. අකුරන්තිලක,
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ(රා.ඉ.)

2017 ඔක්තෝබර් මස 24 වැනි දින,
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව,
මාහේනවත්ත,
පිටිපන,
හෝමාගම.

ආදර්ශ ඉල්ලුම් පත්‍ර ආකෘතිය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා [ ]

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මිනුම් සේවා හා උපකරණ පරීක්ෂක තනතුරුවලට හා රසායනාගාර සහකාර තනතුරු සඳහා පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය- 2017

Limited Competitive Examination for the Recruitment to the Trainee Grade of the Posts of Inspectors of Measurement Services Devices and Lab Assistant of the Sri Lanka Technological Service of Department of Measurement Units Standards and Services- 2017

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ඃ
සිංහල -2
දෙමළ -3 [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ඉංග්‍රීසි- 4

ඉල්ලුම් කරනු ලබන තනතුර ඃ [ ]

මිනුම් සේවා හා උපකරණ පරීක්ෂක තනතුර සඳහා අංක 01 ද, රසායනාගාර සහකාර තනතුර සඳහා අංක 02 ද, තනතුරු දෙකම සඳහා අංක 03 ද යොදන්න. (විභාග නිවේදනයේ 8 වන ඡේදය අනුව)

තනතුරු දෙකම සඳහාම අයදුම් කරන්නේනම් තනතුරට පත්වීමට ඇති කැමැත්තේ අනුපිළිවෙල අනුව අදාළ තනතුර ඉදිරියෙන් අංක 1 හෝ 2 සඳහන් කරන්න.

මිනුම් සේවා හා උපකරණ පරීක්ෂක තනතුර ඃ [ ] රසායනාගාර සහකාර තනතුර ඃ [ ]

---

1. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   උදාහරණ - NIMAL A.B
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

3. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

4. ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.

5. ස්ත්‍රී /පුරුෂ භාවය : (පුරුෂ - 0, ස්ත්‍රී - 1) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

6. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

7. විවාහක/අවිවාහක බව : (විවාහක -1,අවිවාහක -2) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

8. ජන වර්ගය (සිංහල-1,දෙමළ-2,ඉන්දියානු දෙමළ-3,මුස්ලිම්-4,වෙනත්-5) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

9. (*අ*) උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(*ආ*) ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පෙළපතින් ද ලියාපදිංචි කිරීමෙන් ද යන්න සඳහන් කරන්න.(ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න.) :

..........................................................................................................................................

..........................................................................................................................................

11. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් :

11.1 අ.පො.ස (සා.පෙළ) විභාගය :

විභාගය සමත් වූ වර්ෂය :————.
විභාග අංකය :————.

| | විෂයය | ලැබූ සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |
| 11 | | |
| 12 | | |

11.2 වෙනත් අධ්‍යාපනික /වෘත්තීය සුදුසුකම් ඃ

| *විභාගය* | *ආයතනය* | *දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

12. වර්තමාන රැකියාව සහ ඉහත දී යම් පත්වීමක් දැරුවේ නම්. ඃ

| *තනතුර* | *සිට* | *දක්වා* | *වාර්ෂික වැටුප* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

13. ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ පවත්වා/පවත්වමින් තිබේ ද? :————.

14. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියකින් වරදකරු වී තිබේ ද? :————.

15. අදාළ වෙනත් තොරතුරු :————.

16. විභාග ගාස්තුව ගෙවූ තැපැල් කාර්යාලය :————. කුවිතාන්සියේ අංකය :————.

දිනය :————.

| විභාග ගාස්තුව ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

17. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ....................... හා ............................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ කොන්දේසි මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද මා මෙම තනතුරට පත්කර ගැනීමෙන් පසුව වුවද මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බවත් එසේම විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

18. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව :-

ඉහත දී ඇති විස්තර නිවැරදි බවත් /පහත සඳහන් පරිදි සංශෝධනය වියයුතු බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා, එම ලදුපත අලවා ඇති බවත් ඔහුගේ/ඇය ගේ වැඩ සහ හැසිරීම ............................ බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදා හැරිය හැකිය/නොහැකිය.
(අදාළ නොවන වචන කපා හරින්න)

________,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

තනතුර :————.
(නිල මුද්‍රාව මගින් සනාථ කල යුතුය)
දිනය :————.

11-728

---

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සංස්කාරක හා ලේඛන සහකාර III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018**

**First Efficiency Bar Examination for Grade III Documentation Assistants and Editors in the Legal Draftsman's Department– 2018**

01. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සංස්කාරක හා ලේඛන සහකාර නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා-ගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංස්කාරක හා ලේඛන සහකාර නිලධාරීන් සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2018 පෙබරවාරි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i)මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබනඅතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට් නිවේදනයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීතිඋල්ලංඝනය කළහොත්, විභාග කොමාසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු*.-විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකි ය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයකට හෝ පළමුවරට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් ගාස්තු අයනොකෙරේ. ඉන් පසු පෙනී සිටින ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 250.00 විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු. 500.00 විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. අයදුම්පත්‍ර :

අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය ය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කර ගතහැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්කරුගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2017.12.18 වැනි දිනට පෙර ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව - තැ. පෙ. 1503, කොළඹ'', යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවීමේදී ලියුම්

කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන්කර ඇති අයදුම්පත් හා බාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත්, අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟතබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය.*-අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතරින් කුමක් වුවද, භාරගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ii) වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියකියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනාරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

06. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් යොමුකර ඇති අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු ය. එහි දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළයුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ලඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

07. අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

08. විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය,විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

09. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන්ගාස්තු ගෙවනු නොලැබේ.

10. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අපේක්ෂකයෙකු විභාගයට පෙනීසිටීම සඳහා භාෂා මාධ්‍ය ලෙස, තරඟ විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම්, තරඟ විභාගයට පෙනී සිටිනලද භාෂා මාධ්‍ය ද තරඟ විභාග යකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම්ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලුම විෂයන් සඳහා එකම භාෂා මාධ්‍යකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

11. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

12. විභාග පටිපාටිය :

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයන් ගෙන් සමන්විත වනු ඇත.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 01. ආයතන හා කාර්ය පරිපාටි සංග්‍රහය | පැය 01 යි | 100 | 40 |
| 02. මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | පැය 01 යි | 100 | 40 |

විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 01. ආයතන හා කාර්ය පරිපාටි සංග්‍රහය | 1. ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ VII, VIII, XII, XIV, XXIV පරිච්චේද<br>2. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති |
| 02. මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | මුදල් රෙගුලාසි IV, V, VI,IX පරිච්ඡේද |

සටහන -

* ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකි ය.

* නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතුවේ.

13. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

14. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද නීති කෙටුම්පත් සම්පාදකගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

නීති කෙටුම්පත් සම්පාදක,
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව.
කොළඹ 12.

ආදර්ශ අයදුම්පත්‍රය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සංස්කාරක හා ලේඛන සහකාර නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය-2018

**First Efficiency Bar Examination for Grade III Editor/Documentation Assistant in the Legal Draftsman's Department -2018**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):————

(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):————

(උදා : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශපත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන් )

2.4 දුරකථන අංකය : | | | | | | | | | | |

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. ස්ත්‍රී/පුරුෂ භාවය : | |

4.1 පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

| *අනු අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| | | |
| | | |

06. උපන් දිනය :

වර්ෂය : | | මාසය : | | දිනය: | |

07. දැනට දරන තනතුර :

7.1 තනතුර :————

7.2 පත්වීම් ලිපියේ අංකය :————

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද ?:———

8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————

8.3 ලදුපත් අංකය :————

8.4 දිනය :————

| |
|---|
| ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි) (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල්................ ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වන බවද ප්‍රකාශ කරමි.

————
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

*අත්සන සහතික කිරීම :*

මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු/නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ................. මයා./මිය./මෙනවිය ................. දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබා ගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

——————
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය:————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :**

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,

2. නිලධාරියා/නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

——————
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය:————.
දිනය :————.

11-990

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ජනපද නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017)

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත 02 හි සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා පැවැත්වෙන විවෘත තරඟ විභාගය 2018 මාර්තු මාසයේදී කොළඹදී පවත්වනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමවේදය :
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70% කට නොවැඩි සංඛ්‍යාවක් වූ පුරප්පාඩු පහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කළ තැනැත්තන් ලිඛිත පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එහි ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් පුරවනු ලැබේ.

02. **සුදුසුකම් :**

i. *අධ්‍යාපන සුදුසුකම්* : රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව හා කෘෂි තාක්ෂණවේදය යන විෂයන් අතුරින් විෂයයන් 03 කින් අ.පො.ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම

*සහ*

සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.

ii. *වෘත්තීය සුදුසුකම්* : තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාවක් ලබා තිබීම.

03. *වැටුප් පරිමාණය සහ කාණ්ඩය :*
මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් පරිමාණය :
රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550
(වැටුප් කේත අංකය - MN 3-2016 (උපලේඛන අංක 01 අනුව)

04. *වයස් සීමාව :-* ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු 18 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතුය.(ඒ අනුව 1999.12.08 දිනට හෝ ඊට පෙර හා 1987.12.08 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

05. *කායික යෝග්‍යතාව හා අනෙකුත් සේවා කොන්දේසි*
(*අ*) සෑම අයදුම්කරුවෙකුම යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(*ආ*) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.
(*ඇ*) ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුකූලව නියම කරනු ලබන භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.
(*ඈ*) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් වන අතර, අවු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

06. ***විභාග ක්‍රමය***
(*අ*) විභාගය සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.
(*ආ*) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් විභාගයෙන් සාමාර්ථය ලබාගත් ලබාගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් ය.

***සටහන :-***
i. ඉහත ''සුදුසුකම් ලත් විභාගය'' යන පදයෙන් අදහස් කරන්නේ 02 වැනි ඡේදයේ දක්වා ඇති විභාගවලින් එකක් ය.
ii. අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්නවලට එකම භාෂාවකින් ලිවිය යුතු ය.
iii. තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයන්ට ඉඩ දෙනු නොලැබේ.

07. *ලිඛිත පරීක්ෂණයේදී විෂයය නිර්දේශය :-*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා ප්‍රශ්නපත්‍රවලින් යුක්තය. ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්තය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. (කාලය පැය 01) |
| 2. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය හා එහි විකාශය, ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපාර ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය සහ ජනාවාස සැළසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ ව්‍යුහගත රචනා ශෛලියේ ප්‍රශ්න පත්‍රයකි. පහත විෂයයන් පිළිබඳ සරල අවබෝධයක් අපේක්ෂකයන්ගෙන් බලාපොරොත්තු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. (කාලය පැය 03 යි.) |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| | i. **ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය සහ එහි විකාශය**<br>- ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳ ඉතිහාසය<br>- ලේඛන ලියාපදිංචි කිරීම මගින් ඉඩම් අයිතිය තහවුරු කිරීම<br>- ශ්‍රී ලංකාවේ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම<br>ii. **ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ ව්‍යාපාර**<br>- බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් හඳුන්වාදුන් මුඩුබිම් ආඥාපනත සහ එමගින් ඇති වූ සමාජ වෙනස්කම්<br>- 1935 දී ඉඩම් සංවර්ධන ආඥාපනත ආරම්භ වීම සහ ගොවි ජනතාවට ඉඩම්වල අයිතිය ලබාදීම<br>- 1972 දී හඳුන්වාදුන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත සහ එමගින් ඇති වූ ඉඩම් ප්‍රතිසංස්කරණය<br>iii. **ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය**<br>- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති<br>- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාර බෝග නිෂ්පාදනය සහ ආහාර සුරක්ෂිතභාවය<br>- ඉඩම් සංවර්ධනය මගින් ඉඩම් සංවර්ධනය සහ සංරක්ෂණය<br>- ශ්‍රී ලංකාව තුළ ජාතික නිෂ්පාදනයේදී කෘෂිකර්මාන්තයේ දායකත්වය<br>- බෝග විවිධාංගීකරණය<br>- ජල පාලනය<br>- පාංශු සංරක්ෂණය<br>iv. **ජනාවාස සැලසුම්කරණය හා කළමනාකරණය**<br>- ජනාවාස සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ මූලික අංග<br>- සමාජ ආර්ථිකය සමීක්ෂණ<br>- නැවත පදිංචි කිරීම<br>- ප්‍රජා සංවර්ධනය<br>- මූලික යටිතල පහසුකම් සංවර්ධනය |

08. *සම්මුඛ පරීක්ෂණය* :

ලිඛිත පරීක්ෂණයේදී 40% කට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීකෂණයට භාජනය කෙරේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමක් සිදුනොවන අතර, අයදුම්කරුවන්ගේ සහතිකපත්‍ර හා භෞතික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

09. *විභාග කොන්දේසි* :

i. **විභාග ගාස්තු** :
මේ සඳහා විභාග ගාස්තුව රු. 600ක් වන අතර, විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 බැරවන ලෙසට ඉල්ලුම් පත්‍රය භාරගන්නා අවසාන දිනට ප්‍රථම දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවිය යුතුය. තැපැල්/උප තැපැල් කාර්යාලයෙන් අයදුම්කරු නමින් ලබාගත් කුවිතාන්සිය තම ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසා සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

ii. අයදුම්පත්‍රයේ අංක 1 සිට 6.3 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද, ඉතිරිය ඉතිරි පිටුවලට ද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතු අතර එය විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන මාධ්‍යයෙන් තම අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතු වේ. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු වේ. එසේම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත ගෙවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතුය. තවද සම්පූර්ණ කරන ලද

අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව ද සඳහන් කරමි.

iii. *ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම* :

(අ) මෙම නිවේදනයට යාකොට ඇති ආකෘතිය ප්‍රකාරව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් 2017 දෙසැම්බර් මස 08 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට එවිය යුතුය. මෙදිනට පසු ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''ජනපද නිලධාරි විවෘත බඳවා ගැනීම'' යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ඇ) ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් පිරවිය යුතුය.

(ඈ) අත්සන සහතික කිරීමට බලයලත් තැනැත්තකු විසින් අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අත්සන අදළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවාද අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, රාජ්‍ය හෝ අධ්‍යක්ෂ පාලික පාසලක ප්‍රධානියෙකු රු. 240,360 ක් හෝ එයට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය නිලධාරියෙකු බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු ත්‍රිවිධ හමුදවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු යන අය අතරින් කවරෙකු හෝ ලවා සහතික කරවාගත යුතුය.

10. *විභාගයට ඇතුළත් කර ගැනීම* :

(*අ*) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත් නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත්, ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එහිදී ඔබගේ සම්පූර්ණ නම ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ඔබගේ එම විස්තර සමග ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීමද සුදුසු වේ. එසේ විමසීමේදී අවශ්‍ය විටක ඉදිරිපත් කිරීම සඳහා ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදළ ලදුපතේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද සූදනම් කොට තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් වෙතොත් ඔහුට/ඇයට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

(*ආ*) සාමාන්‍ය ගැසට් පත්‍රයේ I කොටසේ (II අ) ඡේදයෙහි පළකර ඇති විභාග අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු නීති මාලාව කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(*ඇ*) විභාගය සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(*ඈ*) විභාග අයදුම්කරුගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පහත සඳහන් අනන්‍යතා පත්‍ර වලින් එකක් පමණකි. :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(ඉ) විභාග ප්‍රතිඵල
මෙම නිවේදනයේ 8 ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයට ලකුණු 40%කට නොඅඩුව ලබාගත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් වන පරිදි සකස් කළ ප්‍රතිඵල ලේඛනය ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk. වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

(ඊ) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

(උ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ලබාදෙනු ලබන උපදෙස්වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම උපදෙස් උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික, රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛන හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවය පිළිබඳ වූ සේවා ව්‍යවස්ථාවට හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

12. අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

13. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කරනු ලැබේ.

14. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර, කිසියම් අනනුකූලතාවයක් හෝ නොගැලපීමක් පවතී නම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ආර් එම්. සී. එම්. හේරත්,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 10 දින,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව.
අංක. 1200/6 මිහිකත මැදුර,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ජනපද නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017)

Open Competitive Examination for Recruitment of Colonization Officers Grade III of the Sri Lanka Technological Service of Land Commissioner General's Department 2016 (2017)

*ගැසට්* නිවේදනයේ 06 වන ඡේදයට අනුව විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

සිංහල 2
දෙමළ -3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 මුලකුරු සමග නම, මුලකුරු අගට යොදා (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදා : GUNAWARDHANA, M. G. B. S. K.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.1 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(ප්‍රවේශ පත්‍රය එවනු ලබන්නේ මෙම ලිපිනයටයි)

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1
පුරුෂ - 0 ☐

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. ජන වර්ගය : ☐
(සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් -4, වෙනත් - 5) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. 6.1 විවාහක/අවිවාහක බව : (විවාහක- 2, අවිවාහක - 1)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

6.2 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

6.3 2017 දෙසැම්බර් මස 08 වැනි දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

07. *ගැසට් නිවේදනයේ* 02.1 හා II අනුව මෙම විභාගයට පෙනී සිටීම සඳහා හිමිකම් ලැබීමට ඔබ ලබා ඇති සුදුසුකම් සඳහන් කරන්න.

i. *අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස. (සා/පෙළ) විභාගය විභාග අංකය :————. වර්ෂය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ...................... | .................. | ...................... | .................. |
| ...................... | .................. | ...................... | .................. |
| ...................... | .................. | ...................... | .................. |
| ...................... | .................. | ...................... | .................. |
| ...................... | .................. | ...................... | .................. |

අ.පො.ස. (උ./පෙළ) විභාගය විභාග අංකය :————. වර්ෂය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ...................... | .................. | ...................... | .................. |
| ...................... | .................. | ...................... | .................. |

ii. *වෘත්තීය සුදුසුකම් :* ..................................................................
..................................................................
..................................................................

08. මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස අයදුම්පත්‍රයට අලවන්න.

| |
|---|
| |

(i) අංකය :————.  (ii) මුදල් ගෙවූ ස්ථානය :————.

(iii) දිනය :————.  (iv) ගෙවන ලද මුදල (රුපියල්) :————.

(මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් තබා ගැනීම පසු විපරම් කිරීමකදී වැදගත් වේ.)

09. *අයදුම්කරුගේ සහතිකය* :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙම විභාගය වෙනුවෙන් ගාස්තුව ගෙවන ලද අංක .......................... හා .......................... දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත්, ප්‍රකාශ කරමි. තවද, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන විභාග නීති රීති අනුව ක්‍රියා කිරීමට එකඟ වෙමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම යටත් වෙමි.

:

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. *අත්සන සහතික කිරීම* :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............... නමැති අයදුම්කරු මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තබන ලද බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන සහ මුද්‍රාව.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය (රබර් මුද්‍රාවකින් සනාථ කරන්න) :————.

11. *අයදුම්කරු රජයේ සේවයේ නියුතු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..................... මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික නිලධාරියෙක් බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

11-919

## නිවැරදි කිරීමයි

**රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශය**

### සංවර්ධන නිලධාරි සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017

2017.11.02 වැනි දින පළ කරන ලද *ගැසට්* අංක 2044 නිවේදන අංක 11-352 යටතේ වූ ඉහත සඳහන් විභාගයේ ආදර්ශ අයදුම්පත්‍රයෙහි 5.0 හි වගුව පහත සඳහන් ආකාරයට නිවැරදි විය යුතුය :-

5.0 ඔබ ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| | |
| | |

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්‍ෂ ජනරාල්.

2017 ක් වූ නොවැම්බර් මස 08 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

11-1078

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.